**ජාතික ආරක්ෂක අරමුදල - 2022**

**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආරක්ෂක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල රු. 53,314,521 ක් වූ ස්ථාවර තැන්පතුවක් රු.54,389,574 ක් ලෙස කල්පිරී ප්‍රති ආයෝජන කර ඇතත් 2022 දෙසැම්බර් 31 දිනට එම තැන්පතුව රු. 53,314,521 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ආයෝජන හා ආයෝජන පොලී ආදායම රු.1,075,054 ක් බැගින් අඩුවෙන් දක්වා තිබුණි. | ස්ථාවර තැන්පතුව කල් පිරීමෙන් පසුව නව වටිනාකම රු.54,389,574 ක් ලෙස නිවැරදි කිරීමට සටහන් තබාගන්නා ලදී. | වර්ෂයට අදාළ නිවැරදි අගයන් ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | රු. මිලියන 200 ක ස්ථාවර තැන්පතුවක් කල් පිරීමට මත්තෙන් 2022 අගෝස්තු 02 දින උපලබ්ධි කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ දින 213 කට අදාලව ලැබී තිබුණු රු. 1,464,152 ක පොලී ආදායම පූර්ව වර්ෂයේ ලාභයට ගලපා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ රු.1,464,152 ක ආයෝජන ආදායම ගිණුම් වලින් නිරූපණය නොවුණි. | මෙම තැන්පතුවට අදාලව 2021.12.31 දිනට ලැබියයුතු පොලී ආදායම ලෙස රු. 1,989,041 ක මුදලක් පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇත. එම ස්ථාවර තැන්පතුව 2022.08. 02 දින උපලබ්ධි කිරීමෙන් ලද රු.1,910,959 ක පොලී ආදායම පූර්ව වර්ෂයේ ලැබියයුතු පොලී ආදායමට සහ වෙනස වන රු.78,082 ක් සමුච්චිත අරමුදලට ගලපා ඇත. | සමාලෝචිත වර්ෂයට අදාලව ලැබුණු ආදායම් එම කාලපරිච්ඡේදයේ ආදායමට ගැලපිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පොලිස් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත 2022 වර්ෂයේදී ලබාදී තිබුණු පරිපාලන වියදම් මුදලින් රු. 109,706 ක් ආපසු ලැබී ඇතත් එය පූර්ව වර්ෂයේ ලාභයට ගලපා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | පොලිස් දෙපාර්තමේන්තුව හා ගුවන් හමුදාව වෙත 2022 වර්ෂයේදී ලබාදෙන ලද පරිපාලන වියදම් මුදල් 2021 වර්ෂයේ මෙත් සෙවන ව්‍යාපෘතියට අදාලව ලබාදෙන ලද පරිපාලන මුදල් ආපසු ලැබීමක් වන බැවින්, එම මුදල් පූර්ව වර්ෂයට ගලපා ඇත. | වර්ෂය තුළ දරන ලද වියදමක් ලෙස ගිණුම්ගතව ඇති බැවින් ආපසු ලැබුණු මුදල එම කාලපරිච්ඡේදයට ගැලපිය යුතුය. |
| (ඈ) | අර්ධ නිවාස ව්‍යාපෘතියේ පරිපාලන වියදම් සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත ලබාදුන් මුදල් උපයෝගීකර ගෙන අනුමැතියකින් තොරව මිලදීගෙන තිබුණු රු. 330,000 ක මුද්‍රණ යන්ත්‍රයක් හා පරිගණක තිර (Monitors) දෙකක වටිනාකම ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් අයකරගතයුතු බව දක්වා ඇතත් එය අරමුදලට අයවියයුතු මුදලක් ලෙස හඳුනාගෙන නොතිබුණු අතර පරිපාලන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අර්ධ නිවාස ව්‍යාපෘතියට අදාළව ත්‍රිවිධ හමුදාව හා ශ්‍රී ලංකා පොලීසිය දරනු ලබන ඉන්ධන වියදම්, වාහන කුලී හා ලිපි ද්‍රව්‍ය ආදී වියදම් සඳහා පරිපාලන වියදම් ලබාදීම අරමුදලේ පාලක මණ්ඩලය මගින් අනුමැතිය ලබාදී ඇතත් එම මුදල් වැයකර මුද්‍රණ යන්ත්‍රය හා පරිගණක තිර මිලට ගැනීම සඳහා පාලක මණ්ඩලයේ අනුමැතියක් ලබාගෙන නොමැති බැවින් එම මුදල ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙතින් අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | පාලන පිළිවෙත් හඳුන්වාදීමට කටයුතු කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නිවාස ආධාර වාරික ගෙවීම | 48,936,509 | තෝරාගත් ප්‍රතිලාභීන් 150 ක් වෙත මෙත් සෙවන අර්ධ නිවාස ආධාර මුදල් ගෙවීම් සඳහා රු.101,426,861 ක් ත්‍රිවිධ හමුදාව හා පොලිසියේ ගිණුම් වෙත මුදාහැර තිබුණු නමුත් ප්‍රතිලාභීන් 82 ක් වෙත ගෙවිය යුතු රු. 48,936,509 ක් සමාලෝචිත වර්ෂය තුළ එම ප්‍රතිලාභීන්ට ලැබුණු බවට සනාථ වන ලේඛණ ඉදිරිපත් නොවුණි. | 2021 වර්ෂයේදී විගණනය විසින් පෙන්වාදී ඇති පරිදි මේ වන විට සනාථන වාර්තා එක් එක් හමුදාවන් වෙතින් සහ අදාල ප්‍රතිලාභීන් වෙතින් ගෙන්වාගනු ලබන අතර, එම සනාථන වාර්තා මේ වන විටත් විගණනය වෙත ඉදිරිපත්කර ඇත. තව දුරටත් ලැබිය යුතු සනාථන වාර්තා පවතින අතර, එම වාර්තා ලද විගස විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ගෙවනු ලබන නිවාස ආධාර මුදල් ලැබුණු බවට තහවුරු කරගැනීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඈ) හා මාර්ගෝපදේශ 04 | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි වන පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තාවක් සකස් කර කාර්තුව අවසන් වී දින 15 කට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවද 2022 වර්ෂය සඳහා එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 877(2) (ඈ) ප්‍රකාරව කාර්තුමය වාර්තා විගණකාධිපති වෙතද ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877 (2) (ඈ) හා මාර්ගෝපදේශ 04 ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.7 ආයෝජන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර තැන්පතු උපලබ්ධි කිරීමෙන් හා අනෙකුත් ආදායම් මගින් අරමුදලේ වියදම් දැරීමෙන් අනතුරුව තවදුරටත් අතිරික්තව පැවති අරමුදල් කෙටිකාලීන ආයෝජන අවස්ථාවක යෙදවීමට හැකියාව පැවතියද 2022 ජනවාරි සිට අප්‍රේල් දක්වා මාස 04 කාලය තුළ රු. 1,200,000 ක අතිරික්ත මුදලක්ද 2022 මැයි සිට දෙසැම්බර් 31 දක්වා මාස 07 ක කාලය තුළ රු. 4,000,000 ක අතිරික්ත මුදලක්ද ආයෝජනය කිරීමකින් තොරව ජංගම ගිණුමක පැවතුණි. | නිවාස ව්‍යාපෘතියේ ගෙවීම් සඳහා ආදායම් ප්‍රමාණවත් නොවන බැවින් ගෙවීම් සිදුකිරීම සඳහා ස්ථාවර තැන්පත් උපලබ්ධිකර එම මුදල් ජංගම ගිණුමේ රඳවා ගනු ලබයි.<br>එසේ උපලබ්ධි කර ලබා ගන්නා මුදල් ඌණ උපයෝජනයකින් තොරව ඵලදායීව ආයෝජනය කිරීම සඳහා සටහන් කර ගන්නා ලදී. | සැලසුම් සහගතව වියදම් දැරීම සහ අතිරික්ත අරමුදල් ආයෝජනය සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | 2022 මැයි මාසයේදී රටතුළ සිදුවූ පොලී අනුපාත ඉහලයාම හේතුවෙන් අඩු පොලී අනුපාතයන් යටතේ ආයෝජිත රු. මිලියන 616.96 ක ස්ථිර තැන්පතු කල්පිරීමේ දිනට මත්තෙන් උපලබ්ධිකර 2022 අගෝස්තු 02 හා 10 යන දිනවලදී ප්‍රති ආයෝජනය කර තිබුණි. මෙම ප්‍රති ආයෝජන පිලිබද තීරණ ගැනීම මාස දෙකකට අධික කාලයක් ප්‍රමාදවී තිබීම හේතුවෙන් පොලී අනුපාත වැඩිවීමෙන් සිදුවූ වාසිය ප්‍රශස්ථ අයුරින් උපයෝජනය කර නොතිබුණි. ඒ අනුව ප්‍රමාද දින 72 ක් සඳහා අහිමිව තිබුණු ඇස්තමේන්තුගත පොලී ආදායම රු. මිලියන 22 කට අධික විය. | 2022 මැයි මාසයේ සිට බැංකු පොලී අනුපාත ඉහල යාම ආරම්භ වූ අතර, එම කාලයේ ජාතික ආරක්ෂක අරමුදල ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පැවතුනි. එම කාලය තුල ස්ථාවර තැන්පත් ප්‍රති ආයෝජනය කිරීමක් සිදුකර නොමැත. අංක 2283/34 හා 2022.06.09 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික ආරක්ෂක අරමුදල, ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය | අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගය පොලී ආදායම වන බැවින් විධිමත් ආයෝජන කලමනාකරණයක් පවත්වාගත යුතුය. |

| | | |
|---|---|---|
| | පථයට ඇතුළත් කරන ලදී. ඉන් අනතුරුව අඩු පොලී ප්‍රතිශතයක් යටතේ පැවති අයෝජන වැඩි පොලී ප්‍රතිශතයක් යටතේ ප්‍රති ආයෝජනය කිරීම සඳහා කටයුතු කරන ලදී.<br>2022 මැයි මාසයේ පැවති පොලී ප්‍රතිශතයද ක්‍රමයෙන් වැඩිවෙමින් පැවති අතර, ජාතික ආරක්ෂක අරමුදලේ පැවති ආයෝජන ප්‍රති ආයෝජනය කරන ලද 2022 අගෝස්තු මාසය වනවිට පොලී ප්‍රතිශතය 26% ක මට්ටමක පැවතුනි. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 17,189,698 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 34,987,345 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 17,797,647 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ස්ථාවර තැන්පතු පොලි ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෙත්සෙවණ අර්ධ නිවාස ව්‍යාපෘතිය යටතේ රණවිරුවන්ගේ අඩක් ඉදිකර ඇති නිවාස සම්පූර්ණ කර ගැනීම සඳහා 2022 වර්ෂයේදී ප්‍රතිලාභීන් 150 ක් වෙත රු.750,000 බැගින් රු. මිලියන 112.50 ක ප්‍රතිලාභ ගෙවා අවසන් කිරීමට සැළසුම් කළද එම වර්ෂය තුල කිසිදු වාරික මුදලක් ගෙවීමට අපොහොසත් වී තිබුණි. එසේම 2021 වර්ෂයේ නිවාස ප්‍රතිලාභීන් 30 ක් සඳහා තෙවන වාරිකය 2022 දෙසැම්බර් 31 දින වනවිටත් ගෙවා නොතිබුණි. 2020 හා 2021 වර්ෂවල ගෙවීම් ප්‍රමාදවීම හා ඉදිකිරීම් ප්‍රමාද වීම මේ සඳහා බලපා තිබුණි. | 2020 වර්ෂයේ සිට පැවැති වසංගත තත්ත්වය හේතුවෙන් ඒ ඒ වර්ෂයන්ට අදාල නිවාස ව්‍යාපෘතීන් එම වර්ෂයන් තුලදීම අවසන් කිරීමට නොහැකි විය. එහි බලපෑම මත 2021 වර්ෂයට අර්ධ නිවාස ව්‍යාපෘතියේ පළමු වාරික මුදල 2022 වර්ෂයේ පෙබරවාරි මාසය දක්වා ප්‍රමාද විය. එම කාලයතුළ රටෙහි පැවැති ආර්ථික අර්බුදකාරී තත්ත්වය හමුවේ අමුද්‍රව්‍ය මිල වැඩිවීම මත නිවාස ඉදිකිරීම් කටයුතු ප්‍රමාද විය.<br><br>2023 වර්ෂයේදී මෙම ප්‍රතිලාභීන්ද ඇතුළත්ව එක් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට පාලක මණ්ඩල ආවරණ අනුමැතිය ලැබී ඇත. | අපේක්ෂිත ඉලක්ක කරා ලඟාවීමට ප්‍රයත්න දැරිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 ක්‍රියාකාරි සැළැස්මට අනුව මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ 2021 වර්ෂයේ 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් සිසු දූ දරුවන් 140 ක් සඳහා රු.25,000 බැගින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම 2022 වර්ෂය තුළ අවසන් කිරීමට සැළසුම් කළද 2022 දෙසැම්බර් 31 වන විටත් ශිෂ්‍යත්ව ප්‍රදානය කර නොතිබුණි. | 2021 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගය සමත් අයදුම්කර ඇති රණවිරු දූ දරුවන් 80 දෙනෙකු තෝරාගෙන ඇති අතර එම ශිෂ්‍යත්ව ප්‍රදානයද කඩිනමින් සිදුකිරීමට මේ වන විට කටයුතු සිදු කරමින් පවතී. | ඒ ඒ වර්ෂයේ සැලසුම් කළ අපේක්ෂිත ඉලක්ක කරා ලඟාවීමටත් සිසු දරුවන්ට කාලීනව ප්‍රතිලාභ පිරිනැමීමටත් ප්‍රයත්න දැරිය යුතුය. |

## 3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රතිලාභීන් වෙත ගෙවීමට නියමිත රු.4,719,806 ක අර්ධ නිවාස වාරික මුදල් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිල ගිණුමක් මගින් ප්‍රතිලාභීන් වෙත මුදාහැරිය යුතු වුවත්, නිල ගිණුමක් ලෙස සනාථ නොවුණු " මධ්‍යම සුහසාධක හා පුනරුත්ථාපන අරමුදල " නමින් පවත්වාගෙන යනු ලබන බාහිර අරමුදලක් හරහා ගෙවීම් සිදුකර තිබුණි. | වාරික මුදල් ප්‍රමාදයකින් තොරව ප්‍රතිලාභීන් වෙත ලබාදීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් "මෙත් සෙවණ" අර්ධ නිවාස ව්‍යාපෘතියට අදාළ මුදල් මධ්‍යම සුහසාධක හා පුනරුත්ථාපන අරමුදල වෙතට යොමු කරන ලෙස ඉල්ලීමක් කර ඇති අතර, ඒ සඳහා පාලක මණ්ඩල අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | අරමුදල විසින් සෘජුව ප්‍රතිලාභ ගෙවීම හෝ රාජ්‍ය අරමුදල් සඳහා වගවන බවට පූර්ණ තහවුරුවක් සහිත ගිණුමක් මගින් මුදල් නිදහස් කිරිම නිර්දේශ කෙරේ. |

## 3.3 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පූර්ව වර්ෂයේ තථ්‍ය වියදම පිළිබඳව සලකා බැලීමකින් තොරව වාර්ෂිකව පරිපාලන වියදම් සඳහා මුදල් ලබාදීම හේතුවෙන් අරමුදලට අයත් රු. 1,490,066 ක් වර්ෂ 03 කට ආසන්න කාලයක් පොලිස් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා නාවික හමුදාව භාරයේ නිෂ්කාර්යව පැවතීමෙන් ආයෝජන අවස්ථාව මගහැරී තිබුණි. | පරිපාලන වියදම් කාරක මුදල් අවශ්‍යතාවන් සඳහා අදාල හමුදාවන් වෙත ලබා දීමෙන් අනතුරුව වර්ෂ අවසානයේ ගිණුම් පියවීම සඳහා ඉතිරි මුදලක් පවතී නම් එම මුදල හෝ වියදම් කරන ලද මුදලට අදාල බිල්පත් ගෙන්වා ගැනීම සිදු කරනු ලබයි.<br>මේ වන විට එක් එක් වර්ෂය අවසානයේ පරිපාලන වියදම් ඉතිරි මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. | ඒ ඒ වර්ෂයේ තථ්‍ය වියදම සලකා බලා පරිපාලන වියදම් ලබාදිය යුතු අතර විධිමත් ආයෝජන කලමනාකරණයක් පවත්වාගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂය දක්වා ජාතික ආරක්ෂක අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ පැවති අතර, 2017 වර්ෂයට අදාල විගණකාධිපති වාර්තාව එම අමාත්‍යාංශය මගින් පාර්ලිමේන්තුවේ සභාගත කර මෙම අමාත්‍යාංශය වෙත දැන්වූ විගස 2018 වර්ෂයේ සිට 2022 දක්වා විගණකාධිපති වාර්තා පාර්මේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලබන බව දැනුම් දෙනු ලැබේ. | 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතුය. |